# නර්තනය - II ශ්‍රේණිය

## (පළමු වාරය )



e තක්සලාව

The National e-learning Portal for the General Education

# විවිධ කලාංගවල සෞන්දර්යාත්මක ලක්ෂණ

## රූපවාහිනීය නාලිකාවල විකාශනය වන අධ්‍යතන වැඩසටහන්

වර්තමානයේ රූපවාහිනීය, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් ලෙස ජනතාව අතර ජනප්‍රිය පාරිභෝගික භාණ්ඩයකි.කාර්ය බහුල ජීවන රටාවකට හුරුවී ඇති බොහෝ ජනයා රූපවාහිනී වැඩසටහන් නැරඹීමට යොමුව තිබේ.මෙහිදී ප්‍රේක්ෂක ජනයා වෙනුවෙන් නාලිකා බොහෝ සංඛ්‍යාවක් බිහිවී ඇත.නර්තන කලාවේ ඉදිරි ගමනට රූපවාහිනියෙන් ලැබෙන පිටිවහල ඉමහත්ය.අතීතයේ ශාන්තිකර්ම සහ නර්තන ප්‍රසංගවලට සීමා වූ නර්තනය රූපවාහිනීය පැමිණීමත් සමඟ විවිධ අරමුණ ඔස්සේ විවිධ මාවත්වල ගමන් කරනු දක්නට ලැබෙන කරුණකි.එම හේතුවෙන් ප්‍රේක්ෂකයා මනා අවබෝධයකින් වැඩසටහන් තෝරා ගැනීම කළ යුතුය .

## රූපවාහිනියෙන් විකාශනය වන අධ්‍යතන වැඩසටහන්

- මුතුහර
- සංචලන
- කවීතා
- පැහැසරණිය
- ගුරු ගෙදර

# රියැලිටි වැඩසටහන්

- Dancing Star
- Super star
- Little Star







# මෙම වැඩසටහන් සම්පාදනයේදී වැදගත් වන කරුණු

1. නර්තනය යොදාගන්නා ආකාරය
2. රංග වස්ත්‍රාභරණ භාවිතය
3. සංගීතය හා වාදන භාණ්ඩ
4. තාක්ෂණික ශිල්ප ක්‍රම

## නර්තනය යොදාගන්නා ආකාරය

© සාම්ප්‍රදායික නර්තන අංග නිර්මාණයේදී දේශීය නර්තන සම්ප්‍රදායන්ට ආවේණික චලන යොදා ගනිමින් නර්තන නිර්මාණය.

© භාරතීය සහ බටහිර ආභාසය නර්තන නිර්මාණයේදී යොදාගැනීම.

© නිර්මාණාත්මක නර්තනාංග වලදී ගී තනු හා සංගීත ඛණ්ඩවල උචිත අනුචිත භාවය.

© නිර්මාණකරණයේදී සාම්ප්‍රදායික චලන භාවිතයේදී දේශීය අනන්‍යතාවයන්ට හානි නොවන අයුරින් නර්තන තන නිර්මාණය.

## රංග වස්ත්‍රාභරණ භාවිතය

® සාම්ප්‍රදායික නර්තන අංග සඳහා ඊට උචිත රංග වස්ත්‍රාභරණ භාවිතය

® භාරතීය,බටහිර නිර්මාණාත්මක රංග වස්ත්‍රාභරණ භාවිතය.

- වර්ණවල ගැලපීම.
- නර්තන සම්ප්‍රදායට අදාළ වීම.
- සංස්කෘතියට ගැලපීම.
- නිර්මාණාත්මක භාවය

මේ අනුව බලන කල අධ්‍යතන රූපවාහිනී නාලිකාවල විකාශනය වන නර්තනනාංග වල විචිත්‍රත්වය රැඳී පවතින්නේ රංග වස්ත්‍රාභරණ භාවිතා කරන ආකාරය අනුවය. මෙහිදී රංග වස්ත්‍රාභරණ යොදා ගැනීමේදී නර්තනයට ඇති උචිත අනුචිත බව පැහැදිලිව වටහාගත යුතුය.

# තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතය

¢ අදිවේගී මන්දවේගී දර්ශන
¢ සමීප දුරස්ථ දර්ශන
¢ ප්‍රතිබිම්බ නිර්මාණය
¢ තාක්ෂණික උපායවලින් ගායනය සහ වාදනය
¢ හඬ පාලනය හා සුසර කිරීම
¢ අවශ්‍ය රූපය පමණක් ඉස්මතු කිරීම .
¢ වෛවර්ණ ආලෝකධාරා භාවිතය

රූපවාහිනී නර්තනවල විචිත්‍රත්වය වැඩිවීම සඳහා ඉහත සඳහන් විවිධ තාක්ෂණික ක්‍රම ශිල්ප භාවිත කරනු ලබයි.මෙහිදී ප්‍රසාංගික ගුණය ඉස්මතු කිරීමෙහි ලා තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතය නර්තන අංගවල අලංකාරය වැඩි කිරීමට හේතු වේ.

## කාර්ය පත්‍රිකාව

- රූපවාහිනී නාලිකාවල විකාශය වන නර්තන වැඩසටහන් තුනක් නම් කරන්න.
- එම වැඩසටහනක දක්නට ලැබෙන නර්තන අංග පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- නර්තනය විචිත්‍රවත් කිරීමට යොදාගත් උපක්‍රම මොනවාදැයි දක්වන්න.
- ඔබ නැරඹූ නර්තන අංගයක් පිළිබඳ ඇගයීමක් කරන්න.